(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 17.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2022 මාර්තු 22 අඟහරුවාදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

7/2022

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නව ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අනුමතිය ලබා දෙන ලද දිනය කවරේද;

(iii) එම නව ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය සකස් කිරීමේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) එය සකස් කර අවසන් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

36/2022

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒක දේශික උභයජීවී විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවියාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති උභයජීවී විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒක දේශික උභයජීවී විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒක දේශික උභයජීවීන් පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒක දේශික උභයජීවීන් ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

246/2022

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බලන්ගොඩ සිට ගුරුබැවිල, මැද්දෙකන්ද සහ හෙළවත්ත යන ගම්වලට දිනකට ක්‍රියාත්මක කරනු ලබන මගී බස් රථ ගමන් වාර සංඛ්‍යාව මෑතක සිට අඩු කර තිබෙන බවත්;

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශවල ජනතාව දැඩි අපහසුතාවයකට ලක්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මාන සඳහා දිනකට ක්‍රියාත්මක කරනු ලබන මගී බස් රථ ගමන් වාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම බස් රථ ගමන් වාර සංඛ්‍යාව වැඩි කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

570/2022

ගරු චමින්ද විජේසිරි මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය විසින් ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 85,000ක් අලෙවි කරන ලද දිනය කවරේද;

(ii) එම ඛනිජ වැලි මිලදී ගැනීම සඳහා අයදුම් කරන ලද එක් එක් සමාගමේ නම, ලිපිනය හා ඉදිරිපත් කරන ලද මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඛනිජ වැලි ලබා ගන්නා ලද එක් එක් සමාගමේ නම, ලිපිනය හා මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ගනුදෙනුවේදී මූල්‍යමය අලාභයක් සිදුවී ඇති බවට ඉදිරිපත් වී ඇති චෝදනා සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1023/2022

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ශිෂ්‍යභට පුහුණුවීම් සිදු කරනු ලබන බව දන්නේද;

(ii) එසේ නම්, ශිෂ්‍යභටයන් පුහුණු කිරීමේ ක්‍රියාකාරකම් සිදු කරනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාසල් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍යභට පුහුණුව ලබා දීමට අපේක්ෂා කරනු ලබන පාසල් තිබෙන බව පිළිගන්නේද;

(ii) එම පාසල්වල ශිෂ්‍යභටයන් පුහුණු කිරීම සඳහා පවතින බාධාවන් හඳුනාගෙන තිබේද;

(iii) ශිෂ්‍යභටයන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය පුහුණුව ගුරුවරුන්ට ලබා දී පාසල් සිසුන්ට ශිෂ්‍යභට පුහුණුව ලබාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1179/2022

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1193/2022

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම සිමෙන්ති කම්හල සතු මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් විවිධ පුද්ගලයන් හා ආයතන විසින් මේ වනවිට අනවසරයෙන් අත්පත් කර ගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් නිරවුල් කර ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1312/2022

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018.03.05 දින මහනුවර, දිගන ප්‍රදේශයේදී ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය පිළිබඳව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා තිබේද;

(iii) එසේ නම්, එවැනි සිද්ධීන් නැවත ඇති වීම වළක්වා ගැනීම සඳහා එම පරීක්ෂණයට අදාළ වාර්තාව මඟින් ලබා දී ඇති නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් සිද්ධියට වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iii) එවැනි සිද්ධීන් නැවත ඇති වීම වළක්වා ගැනීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1470/2022

ගරු රෝහණ බංඩාර මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජලය නොමැති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ග්‍රාම නිලධාරි වසමේ නම සහ පිරිසිදු පානීය ජලය නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1730/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇති ගොවිජන සේවා කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොට්ඨාසවල නම් කවරේද;

(iii) 2021 මහ කන්නය සඳහා පොහොර ඉල්ලුම් කරන ලද වී ගොවීන් සංඛ්‍යාව එම එක් එක් ගොවිජන සේවා කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ අතරින් මේ වනවිට පොහොර නිකුත් කර ඇති වී ගොවීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොහොර ලබාදීම සම්බන්ධයෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවතින ගැටලු විසඳීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා,— 2022 ජනවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2022 මාර්තු 16 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව " වනජීවී හා වන සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව" ලෙස නැවත නම් කළ යුතුය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2021 මාර්තු 09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තව දුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබා දී ඇති කාල සීමාව, 2023 අප්‍රේල් 05 දින දක්වා දීර්ඝ කළ යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ රෙගුලාසි (අංක 1),— 1969 අංක 16, 1981 අංක 27, 1993 අංක 22, 1995 අංක 9 සහ 1996 අංක 20 දරන පනත් මඟින් සංශෝධිත (464 අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ඔක්තෝබර් 28 දිනැති අංක 2251/48 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ එයට සිදු කරන ලද සංශෝධන ද ඇතුළත් 2022 පෙබරවාරි 07 දිනැති අංක 2266/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

*3.

ඉඩම් අමාත්‍යතුමා,— ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ රෙගුලාසි (අංක 2),— 1969 අංක 16, 1981 අංක 27, 1993 අංක 22, 1995 අංක 9 සහ 1996 අංක 20 දරන පනත් මඟින් සංශෝධිත (464 අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනතේ 155 සහ 156 වගන්ති යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 ජනවාරි 15 දිනැති අංක 2262/50 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ එයට සිදු කරන ලද සංශෝධන ද ඇතුළත් 2022 පෙබරවාරි 07 දිනැති අංක 2266/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

*4.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනා සම්මතය,— ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මඟහැරීම වැළැක්වීම සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ තුර්කි ජනරජයේ ආණ්ඩුව අතර 2022 ජනවාරි 28 දින ඇති කරගන්නා ලදුව, 2022.02.24 දින ඉදිරිපත් කරන ලද ගිවිසුම 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අධිභාර බද්ද පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

බලශක්ති අමාත්‍යතුමා,— ඛනිජතෙල් සම්පත් පනත යටතේ නියෝග,— 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 5(3)(ආ) සහ 30(3) වගන්ති සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 ඔක්තෝබර් 15 දිනැති අංක 2249/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.01.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ19(අ) වගන්තිය සමඟ කියවිය යුතු 72 වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2021 දෙසැම්බර් 24 දිනැති අංක 2259/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*10.

තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වගන්තිය සමඟ කියවිය යුතු 34 වගන්තිය යටතේ තරුණ හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2022 ජනවාරි 18 දිනැති අංක 2263/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 213ආ වගන්තිය සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 සැප්තැම්බර් 17 දිනැති අංක 2245/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.03.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*12.

විශේෂ භාණ්ඩ හා සේවා බදු පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

13.

අධිකරණයට අපහාස කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

19.

මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

20.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***